# තනතුරු - ඇබෑර්තු

**වයඹ සංවර්ධන අධිකාරිය**

වයඹ සංවර්ධන අධිකාරියේ අධ්‍යක්ෂ ජනරාල් තනතුර සඳහා බඳවා ගැනීම

වයඹ සංවර්ධන අධිකාරියේ පුරප්පාඩුව පවතින අධ්‍යක්ෂ ජනරාල් තනතුර සඳහා පහත සඳහන් සුදුසුකම්ලත් අයදුම්කරුවන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

01. අධ්‍යක්ෂ ජනරාල් (ස්ථිර) - පුරප්පාඩු සංඛ්‍යාව 01

1. අයදුම්කරු ශ්‍රී ලංකාවේ පුරවැසියෙකු විය යුතුය. (මෙහිදී වයඹ පළාතේ අවම වශයෙන් අවුරුදු 03ක ස්ථිර පදිංචිකරුවන් සඳහා ප්‍රමුඛත්වය ලබාදෙන අතර, පදිංචිය අදාළ ප්‍රදේශයේ ග්‍රාම නිලධාරි විසින් නිකුත් කළ පදිංචි සහතිකයක් මගින් සනාථ කළ යුතුය.)

02. අධ්‍යාපනික හා වෘත්තීය සුදුසුකම් :

* විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයක මූලික උපාධියක්,

*සහ*

කළමනාකරණය/ආර්ථික විද්‍යාව හෝ පරිපාලනය පිළිබඳ පශ්චාත් උපාධියක් සමඟ මානව සම්පත් කළමනාකරණය/ කළමනාකරණයට අදාළව වසර පහ (05) ක සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම ; හෝ

මධ්‍යම කළමනාකාර (MM) සේවා ගණයෙහි I වන ශ්‍රේණියෙහි තනතුරක අවම වශයෙන් වසර පහ (05) ක පළපුරුද්දක් ලබා තිබීම.

03. තනතුරට අදාළ ප්‍රධාන කාර්යභාරය :

- වයඹ සංවර්ධන අධිකාරියේ ප්‍රඥප්තියෙන් පැවරෙන පරිපාලන, කළමනාකරණ සහ සංවර්ධන කටයුතු භාර ප්‍රධාන නිලධාරියා ලෙස කටයුතු කිරීම.

04. වැටුප් පරිමාණය :

HM 1-1 : රු. (140,640 - 15x 4,100 - 202,140)

05. වයස :

- අයදුම්පත් භාරගන්නා අවසන් දිනට වයස අවුරුදු 30ට නොඅඩු සහ අවුරුදු 50ට නොවැඩි විය යුතුය.

06. බඳවා ගැනීමේ ක්‍රමය :

- අයදුම්පත් කැඳවීමෙන් පසු ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක් මගින් බඳවා ගැනීම සිදු කරනු ලබන අතර මූලික සුදුසුකම් සපුරා ඇති අයදුම්කරුවන් පමණක් ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය සඳහා කැඳවනු ලැබේ.

07. ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය :

7.1 පත්වීම් බලධරයා විසින් නියම කරනු ලබන සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයක් මගින් ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක් පවත්වා එම පරීක්ෂණයේ දී ඉහළම ලකුණු ලැබූවන් අතරින් කුසලතා අනුපිළිවෙළ අනුව තෝරාගැනීම් සිදු කෙරේ.

7.2 ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය සඳහා ලකුණු ලබාදෙන ප්‍රධාන ක්ෂේත්‍ර පහත පරිදි වේ.

| ලකුණු ලබාදෙන ක්ෂේත්‍ර | උපරිම ලකුණු ප්‍රමාණය | තෝරා ගැනීමට සලකා බලනු ලබන අවම ලකුණු ප්‍රමාණය |
|---|---|---|
| මූලික සුදුසුකම්වලට අමතර වෙනත් අධ්‍යාපන/වෘත්තීය සුදුසුකම් | 25 | 50 |
| තනතුරෙහි කාර්යභාරයට අදාළ අතිරේක පළපුරුද්ද | 30 | |
| අනෙකුත් කාර්ය සාධනයන් හා කුසලතා | 35 | |
| සම්මුඛ පරීක්ෂණයේ දී දක්වන කුසලතාව | 10 | |

7.2.1 7.2 හි සඳහන් ප්‍රධාන ක්ෂේත්‍රවලට අදාළව ලකුණු ලබාදෙන නිර්ණායක හා ලකුණු ප්‍රමාණයන් :

<table>
<tr><th>අ. අ</th><th colspan="3">නිර්ණායක</th><th colspan="3">ලකුණු</th></tr>
<tr><td rowspan="7">01</td><td rowspan="7">වෙනත් අධ්‍යාපන/ වෘත්තීය සුදුසුකම්</td><td rowspan="6">අධ්‍යාපන සුදුසුකම්</td><td rowspan="4">මූලික සුදුසුකම්වලට අමතරව පිළිගත් ආයතනයකින් පිරිනමන ලද ඩිප්ලෝමා, උපාධි, පශ්චාත් උපාධි ඩිප්ලෝමා සහ පශ්චාත් උපාධි</td><td>ඩිප්ලෝමා</td><td>ලකුණු 01</td><td rowspan="4">උපරිම ලකුණු 12</td></tr>
<tr><td>උපාධි</td><td>ලකුණු 02</td></tr>
<tr><td>පශ්චාත් උපාධි ඩිප්ලෝමා</td><td>ලකුණු 04</td></tr>
<tr><td>පශ්චාත් උපාධි</td><td>ලකුණු 05</td></tr>
<tr><td>පිළිගත් ආයතනයකින් පිරිනමන ලද පරිගණක විද්‍යාව/තොරතුරු තාක්ෂණ ඩිප්ලෝමා</td><td colspan="3">ලකුණු 03</td></tr>
<tr><td>වෙනත් භාෂා ප්‍රවීණතාවය (පිළිගත් ආයතනයකින් පිරිනමන ලද සහතිකය)</td><td colspan="3">ලකුණු 03</td></tr>
<tr><td>වෘත්තීය සුදුසුකම්</td><td>ක්ෂේත්‍රයට අදාළ වරලත් ආයතනයක සාමාජිකත්වය/තනතුරු දැරීම</td><td colspan="3">ලකුණු 07</td></tr>
<tr><td colspan="4">නිර්ණායකයට අදාළ මුළු ලකුණු</td><td colspan="3">ලකුණු 25</td></tr>
<tr><td rowspan="2">02</td><td rowspan="2">අදාළ අතිරේක පළපුරුද්ද</td><td colspan="2">මූලික සුදුසුකම් සඳහා සලකා බලන ලද පිළිගත් ආයතනයක කළමනාකරණ මට්ටමේ තනතුරක වසර 05කට වඩා වැඩි පළපුරුද්ද (වැඩිවන එක් වර්ෂයකට ලකුණු 03 බැගින්)</td><td colspan="3">උපරිම ලකුණු 15</td></tr>
<tr><td colspan="2">මූලික සුදුසුකම් සඳහා සලකා නොබලන ලද පිළිගත් ආයතනයක කළමනාකරණ මට්ටමේ තනතුරක වසර 05කට වඩා වැඩි පළපුරුද්ද</td><td>එක් වර්ෂයකට ලකුණු 03 බැගින්</td><td colspan="2">උපරිම ලකුණු 15</td></tr>
<tr><td colspan="4">නිර්ණායකයට අදාළ මුළු ලකුණු</td><td colspan="3">ලකුණු 30</td></tr>
<tr><td rowspan="5">03</td><td rowspan="5">අනෙකුත් කාර්ය සාධනයන් හා කුසලතා</td><td colspan="2">ආයතනයේ ඉදිරි දියුණුව සහ උන්නතිය උදෙසා සිදුකරනු ලබන යෝජනා සහ ක්‍රියාකාරකම් ඇතුළත් විනාඩි 10 ක ඉදිරිපත් කිරීම</td><td colspan="3">ලකුණු 12</td></tr>
<tr><td colspan="2">පර්යේෂණ හා ප්‍රකාශන</td><td colspan="2" rowspan="2">එක් පර්යේෂණයක්/ප්‍රකාශනයක් සඳහා ලකුණු 2.5 බැගින්</td><td rowspan="2">උපරිම ලකුණු 05</td></tr>
<tr><td colspan="2"></td></tr>
<tr><td colspan="2">විශේෂ ජයග්‍රහණ, සමාජ වගකීම් හා නායකත්ව කුසලතාව</td><td colspan="3">උපරිම ලකුණු 13</td></tr>
<tr><td colspan="2">ඉංග්‍රීසි භාෂා හැකියාව (ලිඛිතව සහ වාචිකව අදහස් ප්‍රකාශ කිරීම)</td><td colspan="3">උපරිම ලකුණු 05</td></tr>
<tr><td colspan="4">නිර්ණායකයට අදාළ මුළු ලකුණු</td><td colspan="3">ලකුණු 35</td></tr>
<tr><td>04</td><td colspan="3">සම්මුඛ පරීක්ෂණයේ දක්වන සමස්ත කුසලතාවය</td><td colspan="3">ලකුණු 10</td></tr>
<tr><td colspan="4">මුළු ලකුණු</td><td colspan="3">ලකුණු 100</td></tr>
</table>

08. අයදුම්පත් ඉදිරිපත් කිරීම.-

8.1 අධ්‍යක්ෂ ජනරාල් තනතුරට ඉල්ලුම් කිරීම සඳහාවන අයදුම්පත මෙම නිවේදනයේ දක්වා ඇති ආදර්ශ ආකෘතියට අනුකූල විය යුතු අතර, එය A4 ප්‍රමාණයේ කඩදාසියේ දෙපැත්තම ප්‍රයෝජනයට ගනිමින් සකස්කර අපේක්ෂකයා විසින් තම අත් අකුරින්ම සම්පූර්ණ කළ යුතු ය.

8.2 නිසි පරිදි සම්පූර්ණ කරන ලද අයදුම්පත අධ්‍යාපන හා වෘත්තීය සුදුසුකම් සනාථ කරන සහතිකවල හා සේවා සහතිකවල සහතික කරන ලද පිටපත් සහ අනෙකුත් අදාළ ලේඛන සමග අයදුම්පත් බාරගන්නා අවසන් දිනට හෝ ඊට පෙර ලැබෙන සේ **"අධ්‍යක්ෂ ජනරාල්, වයඹ සංවර්ධන අධිකාරිය, මඟුරුඔයවත්ත, නව මල්කඩුවාව, බෝයගනේ"** යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් හෝ තැපැල් කුරියර් සේවාව මගින් එවිය යුතුයි. අයදුම්පත බහාලන කවරයේ වම් පස ඉහළ කෙළවරේ **"වයඹ සංවර්ධන අධිකාරියේ අධ්‍යක්ෂ ජනරාල් තනතුර සඳහා බඳවා ගැනීම"** යනුවෙන් සඳහන් කළ යුතු ය.

*සැලකිය යුතුයි* : දැනටමත් රාජ්‍ය සේවයේ හෝ පළාත් රාජ්‍ය සේවයේ ස්ථිර තනතුරක සේවයේ නියුතු අයදුම්කරුවන් තම අයදුම්පත් දෙපාර්තමේන්තු/ආයතන ප්‍රධානියා මගින් එවිය යුතුය.

8.3 ආදර්ශ ආකෘතියට අනුකූල නොවන හෝ නියමිත දිනට පසුව ලැබෙන හෝ අසම්පූර්ණ හෝ අයදුම්පත් කිසිදු දැනුම්දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ. තැපෑලේදී ප්‍රමාදවන හෝ නැතිවන හෝ අයදුම්පත් පිළිබඳව ද මෙම නිවේදනයේ සඳහන් කර ඇති ලිපිනයට හැර වෙනත් අය වෙත යොමු කෙරෙන අයදුම්පත් පිළිබඳව ද කරනු ලබන පැමිණිලි සලකා බලනු නොලැබේ.

8.4 අයදුම්කරුගේ අත්සන සහතික කිරීම.-

අයදුම්පත්‍රයේ අපේක්ෂකයාගේ අත්සන රජයේ පාසලක විදුහල්පතිවරයෙකු/විශ්‍රාමික ආයතන ප්‍රධානියෙකු/කොට්ඨාසයේ ග්‍රාම නිලධාරි තැන/සාමදාන විනිශ්චයකරුවෙකු/දිවුරුම් කොමසාරිස්වරයෙකු/නීතිඥවරයෙකු/ප්‍රසිද්ධ නොතාරිස් කෙනෙකු/ ත්‍රිවිධ හමුදාවේ අධිකාරිලත් නිලධරයෙකු/පොලිස් සේවයේ *ගැසට්* කළ තනතුරක් දරන නිලධාරියෙකු හෝ රු. 71,240/- කට වැඩි මූලික මාසික වැටුපක් ලබන රජයේ ස්ථිර තනතුරක් දරන මාණ්ඩලික නිලධාරියෙකු හෝ බෞද්ධ විහාරස්ථානයක විහාරාධිපති හෝ නායක ස්වාමීන්වහන්සේ කෙනෙකු හෝ අන්‍යාගමික පූජක ස්ථානයක භාරකාරිත්වය දරන කෙනෙකු හෝ මගින් සහතික කරවා ගත යුතු ය.

09. අයදුම්පත් බාරගන්නා අවසාන දිනය : **2026.11.06**

10. අයදුම්කරු තනතුරට පැවරෙන කාර්යයන් මැනවින් ඉටු කිරීම සඳහා අවශ්‍ය වන කායික හා මානසික යෝග්‍යතාවයෙන් යුක්ත විය යුතුය.

11. විශිෂ්ට චරිතයෙන් යුක්ත විය යුතු ය.

12. තනතුරට බඳවා ගැනීම සඳහා ඉල්ලුම් කිරීම පිණිස අවශ්‍ය සුදුසුකම්, *ගැසට්* පත්‍රයේ සඳහන් අයදුම්පත් කැඳවීම් අවසන් දින වන විට සෑම ආකාරයකින්ම සම්පූර්ණ කර තිබිය යුතුය.

13. මෙම තනතුර දරන්නා සේවක අර්ථසාධක අරමුදලට සහ සේවා නියුක්තිකයින්ගේ භාරකාර අරමුදලට දායකවන අතර, විශ්‍රාම වැටුපකට හිමිකම් නොලබයි.

14. සාවද්‍ය තොරතුරු සැපයීම සඳහා දඬුවම්.-

අයදුම්කරුවෙකු විසින් කිසියම් කරුණක් සාවද්‍ය බව දැන දැනම ඉදිරිපත්කර ඇති බව හෙළිවුවහොත්, එසේත් නැතිනම් යම් වැදගත් කරුණක් හෝ ඔහු/ඇය ඕනෑකමින් යටපත්කර ඇත්නම් ඔහු/ඇය සේවයෙන් පහකරනු ලැබීමට යටත් වනු ඇත.

15. අයදුම්පත් කැඳවීමේ නිවේදනයට අදාළ කරුණු හෝ එම නිවේදනයෙන් ආවරණය නොවන හෝ එම නිවේදනයේ විධිවිධාන සලසා නොමැති වෙනත් කිසියම් කරුණක් හෝ සම්බන්ධයෙන් වයඹ සංවර්ධන අධිකාරියේ තීරණය අවසාන තීරණය වේ.

16. ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය පැවැත්වීම, කල් දැමීම, අවලංගු කිරීම හෝ පැවැත්වීමෙන් පසු තෝරාගැනීම/නොගැනීම හෝ සම්බන්ධයෙන් අවසාන තීරණය වයඹ සංවර්ධන අධිකාරිය සතුය.

17. සිංහල, දෙමළ හා ඉංග්‍රීසි මාධ්‍යයෙන් පළවන මෙම නිවේදනයේ භාෂා පාඨ අතර කිසියම් නොගැලපීමක් හෝ අනනුකූලතාවයක් ඇති බව පෙනී යන්නේ නම් එවැනි අවස්ථාවක සිංහල මාධ්‍ය නිවේදනය නිවැරදි සේ සලකා කටයුතු කරනු ලැබේ.

සභාපති,
වයඹ සංවර්ධන අධිකාරිය.